රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:- 255

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1984 ජූනි මස 6 දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**ක්‍රීඩාවන්හි හෝ ක්‍රීඩා සම්බන්ධ වෙනත් කටයුතුවල නිරතවන රජයේ නිලධාරයන්ට පූර්ණ වැටුප් සහිත විශේෂ නිවාඩු දීම.**

ක්‍රීඩාවන්හි හෝ ක්‍රීඩා සම්බන්ධ වෙනත් කටයුතුවල නිරතවන රජයේ නිලධාරයෙකුට පහත සඳහන් ඕනෑම අවස්ථාවක දී පූර්ණ වැටුප් සහිත විශේෂ නිවාඩු ලබාදිය යුතුය. එනම්, ඔහු

(අ) ලංකාවේ දී හෝ විදේශයකදී හෝ ඕනෑම ක්‍රීඩාවක් සඳහා ක්‍රීඩකයෙකු වශයෙන් ශ්‍රී ලංකාව නියෝජනය කිරීමට තෝරාගත්විට.

(ආ) ශ්‍රී ලංකාවේ දී හෝ විදේශයකදී හෝ ජාතික ක්‍රීඩා කණ්ඩායමක නිලධාරයෙකු වශයෙන් කටයුතු කරන විට.

(ඇ) ජාත්‍යන්තර තරඟයකට ප්‍රථම පූර්ව පුහුණු කඳවුරකට සහභාගි වන විට.

(ඈ) ක්‍රීඩා විෂය භාර අමාත්‍යාංශය අනුමත කළ පුහුණු කිරීම් හෝ විනිශ්චය කිරීම් පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයකට හෝ පාඨමාලාවකට සහභාගි වන විට.

02. එවැනි රජයේ නිලධාරයෙකුට පහත සඳහන් ඕනෑම අවස්ථාවකදී දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ අභිමතය පරිදි උක්ත නිවාඩු අනුමත කළ හැක.

(අ) ජාතික ක්‍රීඩකයෙකු ලෙස ක්‍රීඩා විෂය භාර අමාත්‍යාංශය පිළිගත් සාමාන්‍ය පුහුණුවීම් සැසියකට යන විට.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය සේවා ක්‍රීඩා සංගමයක් සංවිධානය කරන මෙරට ක්‍රීඩා තරඟයකට සහභාගි වන විට.

(ඇ) එවැනි ක්‍රීඩා තරඟයක දී තීරකයෙකු හෝ විනිශ්චය කරුවෙකු හෝ වශයෙන් කටයුතු කරන විට.

03. ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 12:5 හා 12:6 යන උප වගන්ති මේ අනුව මතුවට සංශෝධනය කෙරේ.

ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.